විගණකාධිපති චක්‍රලේඛ අංක - 2017/04 2017 පෙබරවාරි දින

විගණකාධිපති දෙපාර්තමේන්තුව

306/72

පොල්දූව පාර

බත්තරමුල්ල

සියළුම නිලධාරීන් වෙත,

**බාහිර ආයතනවලට යොමු කරන රාජකාරි ලිපි ඉදිරිපත් කිරීම**

---------------------------------------------------------------------

මෙ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1995 ජනවාරි 09 දිනැති අංක සීබී 57 දරන කාර්යාල චක්‍රලේඛය මෙයින් අවලංගු වන අතර රාජකාරි ලිපි ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

1. සේවා ප්‍රශ්න හෝ අනෙකුත් කරුණු සම්බන්ධයෙන් වෙනත් ආයතනයකට දෙපාර්තමේන්තු නිලධාරින් විසින් කරනු ලබන නියෝජන, ඉල්ලීම් හෝ අභියාචනා දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

2. දෙපාර්තමේන්තුවෙන් පිටතට තම විගණිත ආයතනය, මහා භාණ්ඩාගාරය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, ජනාධිපති කොමිසම, මූල්‍ය හා අපරාධ විමර්ශන කොමිසම ආදී ආයතනවලට ඉදිරිපත් කෙරෙන සියළුම වැදගත් ලිපි හා වාර්තා අධීක්ෂණ නිලධාරියා, අංශ ප්‍රධානියා හා එම එක් එක් කරුණට අදාළ වෙනත් අංශ ප්‍රධානියකු වේ නම් ඔහු හරහා දෙපාර්තමේන්තුවේ තැපැලෙන් ලියාපදිංචි තැපැලට යොමු කළ යුතු වන අතර, අවශ්‍ය අවස්ථාවලදී අතින් බෙදා හැරීමට කටයුතු කළ යුතුය. එසේ යොමු කළ බව තහවුරු කිරීම සඳහා වූ ලේඛන ගොනු ගත කිරීමට වග බලාගත යුතුය.

3. තම අංශයට පරිභාහිරව වෙනත් අංශයකට අදාළ ආයතනයකින් තොරතුරු කැඳවීමක් හෝ පැහැදිළි කර ගැනීමක් අවශ්‍ය වේ නම් අදාළ අංශ භාර නිලධාරීන් මඟින් හෝ ඔහු වෙත පූර්ව දැනුම් දීමෙන් අනතුරුව ඔහුගේ එකඟතාවය ඇතිව එම කාර්ය ඉටුකර ගත යුතුය.

විගණකාධිපති